**ශීර්ෂය 276 - බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 276 - බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 05 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් හා සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය හා ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

(අ) **මුළු ප්‍රතිපාදනය හා වියදම**

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 735.55 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 710.76 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 24.79 ක් හෙවත් සියයට 3.37 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2015 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 617.55 | 612.98 | 4.57 | 0.74 |
| මූලධන | 118.00 | 97.78 | 20.22 | 17.14 |
| **එකතුව** | **735.55** | **710.76** | **24.79** | **3.37** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අමාත්‍යාංශ 24 ක් හා දෙපාර්තමේන්තු 17 ක් විසින් එකතුව රු.මිලියන 2,103.34 ක ප්‍රතිපාදන සලසා දි තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 1,979.74 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 123.60 ක් හෙවත් සියයට 5.88 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 27601 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 45.73 | 39.81 | 33.73 | 39.23 | 156.00 | 129.27 |

## 2.3 අග්‍රිම ගිණුම

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට අංක 7002/0000/00/0315/0015/000 දරන අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 104.81 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම් 06 ක ශේෂ එකතුව රු. මිලියන 469.23 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0058/000 | 0.72 |
| 6000/0000/00/0002/0076/000 | 0.23 |
| 6000/0000/00/0013/0047/000 | 38.47 |
| 6000/0000/00/0016/0028/000 | 307.33 |
| 6000/0000/00/0017/0007/000 | 121.78 |
| 6000/0000/00/0018/0035/000 | 0.70 |
| **එකතුව** | **469.23** |

## 2.5 විගණන නිරීක්ෂණය

බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 විසර්ජන ගිණුම

#### 3.1.1 අයවැය විචලනය

වැය විෂයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14 ක සිට සියයට 30 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

#### 3.1.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දි තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) **ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 07 ක 2015 වර්ෂයේ ක්‍රියාත්මක කර තිබූ සංවර්ධන ව්‍යාපෘති 44ක ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී මාර්ග මිල ගණන්වලට ( HSR) අනුව නිවැරදි රේටයන් හා ප්‍රමාණයන් යොදා ගෙන තිබුණි. මේනිසා සාවද්‍ය ගණනය කිරීම් හා ව්‍යාජ පිරිවැය ඇතුළත් කිරීමෙන් අදාළ කොන්ත්‍රාත්කරුවන්ට රු. 2,508,343 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 04 ක සංවර්ධන ව්‍යාපෘති 04 ක් සඳහා ව්‍යාජ මිනුම් සහ ඉටු නොකරන ලද කාර්යයන් මත ගෙවීම් කිරීම නිසා රු.257,319 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(iii) ප්‍රාදේශිය ලේකම් කාර්යාල 03 ක රු.4,632,819 ක නිමි වැඩ වටිනාකමක් සහිත කොන්ක්‍රීට් මාර්ග 05 ක කොන්ක්‍රීට්වල ශක්තිය මැනීමේ උපකරණයට අනුව අවම සම්මත අගයවත් ලැබී නොතිබුණද කොන්ක්‍රීට් ඉදිකිරීම වෙනුවෙන් රු.1,420,544 ක් ගෙවීම් කර තිබුණි.

(iv) හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති 14 කට අදාළව රු.41,280 ක් වැඩිපුර ගෙවා තිබුණත්, එම වැඩි පුර ගෙවා තිබුණු මුදල 2016 අගෝස්තු 19 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(v) රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ඉටු නොකළ කාර්යයන් වෙනුවෙන් රු.157,422 ක් වැඩිපුර ගෙවා තිබුණි. ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් එම මුදල අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(vi) හපුතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද රු.16,317,942 ක ඇස්තමේන්තු වටිනාකමක් සහිත ගොඩනැගිලි ඉදිකිරීම් 07 ක් සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**(ආ) ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය**

**-----------------------------------**

ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද ගර්භණී මව්වරුන් සඳහා රු.20,000 ක පෝෂ්‍යදායි ආහාර මල්ලක් ලබා දීමේ වැඩසටහන සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) බදුල්ල, මහියංගණය, හා සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දිස්ත්‍රික් ප්‍රසම්පාදන කමිටුවේ තීරණ ලබා ගැනීමට පෙර ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව විසින් තෝරා ගන්නා ලද සැපයුම්කරුවන්ගෙන් ආහාර ද්‍රව්‍ය ලබාගෙන තිබුණි.

(ii) බදුල්ල හා මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් බිල්පත් ලබා ගැනීමකින් තොරව ආහාර ද්‍රව්‍ය සැපයූ කූපන්පත් 2,308 ක් සඳහා රු.630,854 ක් සැපයුම්කරුවන් වෙත වැඩිපුර ගෙවා තිබුණි.

(iii) බදුල්ල, වැලිමඩ හා ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නිර්දේශිත ආහාර වෙනුවට පරිභෝජනයට නුසුදුසු ආහාර ද්‍රව්‍ය ලබාදී තිබුණි.

(iv) 2015 මාර්තු 19 දිනැති අංක 1906/47 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් මිල ගණන්වලට වඩා වැඩි වටිනාකම් සහිත මිල ගණන් ඉදිරිපත් කර තිබූ සැපයුම්කරුවන් සඳහා සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා දී තිබුණි. ඒ අනුව අදාළ සැපයුම්කරුවන් වෙත රු.208,088 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි.

(v) ප්‍රසම්පාදන තීරණයේ සඳහන් මිල ගණන්වලට වඩා වැඩි මිල ගණන් අයකිරීම හේතුවෙන් වැලිමඩ හා ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් රු.162,019 ක් අදාළ සැපයුම්කරුවන් වෙත වැඩිපුර ගෙවා තිබුණි.

**(ඇ) ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය**

**----------------------------**

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය විසින් ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම සම්බන්ධයෙන් සිදු කල නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i). බණ්ඩාරවෙල, ඌවපරණගම, ඇල්ල, බදුල්ල හා සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අයත් සමෘද්ධි බැංකු සංගම් 13 ක් හා ප්‍රජාමූල බැංකු 03 ක් විසින් 2007 සිට 2013 වර්ෂය දක්වා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් ලබාදී තිබූ ණය මුදල්වලින් ප්‍රතිලාභින් 1263 දෙනෙකුගෙන් රු.3,806,722 ක මුදලක් අයකරගෙන නොතිබුණි.

(ii). බදුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැන්දගොල්ල දිවි නැගුම ප්‍රජාමූල බැංකුව විසින් 2014 වර්ෂයේ දී ලබාදුන් රටවිරු නිවාස ණයවලින් 2015 ඔක්තෝබර් 30 දින වන විට අඛණ්ඩව වාරික 09 ක් නොගෙවූ ප්‍රතිලාභින් 07 දෙනෙකුගෙන් අය විය යුතු රු. 573,660 ක ණය ආපසු අයකර ගෙන නොතිබුණි.

## 3.2 පොදු තැන්පත් ගිණුම

----------------------

2015 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු.196,727,221ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

-------------------------------------------------------------------

විෂය අංක 27601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දින විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.5,969,182 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 22 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණත්, අයකර ගෙන නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(අ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(i) 2014 වර්ෂයේ ආරම්භ කරන ලද වේවත්ත පන්සල ළිඳ මගින් පානීය ජල සැපයීමේ ව්‍යාපෘතිය 2015 ජුනි 15 දින රු.1,908,808 ක් වැය කර වැඩ අවසන් කර තිබූ නමුත් 2015 දෙසැම්බර් 03 දින වන විටත් ප්‍රතිලාභීන්ට පානීය ජලය සපයා නොතිබුණි.

(ii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 07 ක් මාස 09 ක සිට වර්ෂ 07 ක් දක්වා කාලපරාසයක සිට අලුත්වැඩියා නොකර කාර්යාල භූමියෙහි නිෂ්කාර්යව රඳවා ගෙන තිබුණි.

(ආ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම**

--------------------------------------------

මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් යතුරු පැදි දෙකක් සම්බන්ධයෙන් 2014 සමීක්ෂණ මණ්ඩල නිර්දේශ අනුව කටයුතු කර නොතිබුණි.

## 3.5 අනුකූල නොවීම

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 104(4) | 3,056,306 | අලාභ හානියක් සිදු වූ දිනයේ සිට මාස 3 ක් ඉකුත් වීමට මත්තෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතුව තිබුණි. නමුත් හානි 13 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. බොහෝ පූර්ණ වාර්තාවල අදාළ බලධාරීන්ගේ අත්සන් සමග නිල මුද්‍රා මඟින් සහතික කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396(ඇ) | 6,288,871 | බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2015 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශ අනුව නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ කල් ඉකුත් වූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| **(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| 2011 ජූනි 29 දිනැති අංක EST7/ TRAVEL/06/3030 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපිය | 228,021 | බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක ගණකාධිකාරී තනතුරෙහි වැඩබැලීම වෙනුවෙන් සංයුක්ත දීමනා ලබාගෙන තිබුණි. |

## 3.6 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අඩුපාඩු පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

සමාලෝචිත වර්ෂයේදී පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කළ යුතුව තිබුණත්, වර්ෂය අවසාන වන විටත්, එම ව්‍යාපෘති ආරම්භ නොකර අතහැර තිබුණි.

| ව්‍යාපෘතිය | | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|
| | | රු. | |
| (i) | ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කුරුවිගොල්ල බටවත්ත කොටසට පානීය ජලය ලබා දීම | 200,000 | ජල පෝෂක ප්‍රදේශය නියං කාලවලදී සිඳීයෑම හේතුවෙන් ව්‍යාපෘතිය සාර්ථක නොවීම. |
| (ii) | සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සාර්නියා කොඩිලන්ඩ් කොටසේ කෝවිල අලුත්වැඩියාව | 499,767 | ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සකස් කළ ඇස්තමේන්තු වැඩ කොටස් පළාත් සභා ප්‍රතිපාදන තුළින් ඉටු කර ඇති බැවින් නැවත ඇස්තමේන්තුව සංශෝධනය කර ව්‍යාපෘතිය සංවර්ධනය කිරීමට අනුමැතිය අමාත්‍යාංශයෙන් ඉල්ලන ලද නමුත් අනුමැතිය ලැබී නොතිබීම. |
| (iii) | හාලිඇල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ස්ප්‍රිංවැලි 04 වන කොටසේ කරන සංවර්ධන කටයුතු | 200,085 | අධික වර්ෂාව හේතුවෙන් වැඩ නිම කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් නොතිබීම. |
| (iv) | හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පූනාගල පහළ කොටස කෝවිල් ගොඩනැගිල්ල ඉදිකිරීම | 499,860 | අධික වර්ෂාව හා වැඩ නිම කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් නොතිබීම. |

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් බදුල්ල සේනානායක පිට්ටනියේ භූගත රථගාලක් ඉදිකර ඒ මත උද්‍යානයක් සකස් කිරීම සහ දැනට තිබෙන උද්‍යානය සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.66,466,296 ක ඇස්තමේන්තුගත වටිනාකමකට 2013 දෙසැම්බර් 15 දින ආරම්භ කර තිබුණි. එම ව්‍යාපෘතිය වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරියට රු.25,000,000 ගෙවීම් කර තිබුණද 2015 දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.

**(ඇ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘති | ඇස්තමේන්තු ගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | 2015.12.31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|
| ---------- | --------------- | ------------- | ------------- | -------------- | ---------------- |
| | රු. | | | රු. | |
| **රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | | | | | |
| ------------------------ | | | | | |
| සසබෝපුර ගොවි සංවිධාන ගබඩාවක් ඉදිකිරිම | 980,000 | 2015.10.09 | 2015.12.25 | 796,591 | අධික වර්ෂාව. |
| වෙලැම්පල ප්‍රජාශාලාව ඉදිකිරීම | 980,000 | 2015.09.28 | 2015.12.28 | 566,355 | අධික වර්ෂාව. |
| අරළුපිටිය පෙර පාසල් මධ්‍යස්ථානය ඉදිකිරීම | 980,000 | 2015.09.18 | 2015.12.28 | 196,000 | අධික වර්ෂාව හා කොන්ත්‍රාත් සමිති යට ප්‍රමාණවත් පිරිස් බලයක් නොමැති වීම. |
| වකුගඩු නිවාරනය සඳහා වූ පාසල් ජල ව්‍යාපෘති වැඩසටහන | 8,368,200 | 2015.07.21 | 2015.12.25 | 5,251,641 | ප්‍රසම්පාදන තීරණ නොමැති වීම. |
| **මහියංගණය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | | | | | |
| ------------------------ | | | | | |
| වේවත්ත මොරකැටිය ප්‍රජාශාලාව ඉදිකිරීම | 980,000 | 2015.09.02 | 2015.12.15 | 574,855 | අධික වර්ෂාව. |
| වකුගඩු නිවාරනය සඳහා වූ පාසල් ජල ව්‍යාපෘති වැඩසටහන | 16,852,000 | 2015.07.21 | 2015.12.25 | 7,846,458 | ප්‍රසම්පාදන තීරණ නොමැති වීම. |

**ඌවපරණගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

| | | | | | |
|---|---|---|---|---|---|
| වැතලාව මැද මූකලාන හරහා ගොඩ මූකලාන දක්වා මාර්ගය බෝක්කු දමා සංවර්ධනය කිරීම | 980,000 | 2015.08.26 | 2015.11.26 | 211,942 | අධික වර්ෂාව. |
| ප්‍රජාශාලා ගොඩනැගිල්ල සහ සේවා පියස ඉදිකිරීම | 980,000 | 2015.10.21 | 2015.1130 | 745,040 | අධික වර්ෂාව. |
| බ/ තුප්පිටිය විදුහලේ ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 519,000 | 2015.12.02 | 2015.12.23 | 134,752 | අධික වර්ෂාව |

## 3.8 අවිධිමත් ගනුදෙනු

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැර වීම**

බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.39,900 ක් වටිනා කාර්යාල උපකරණ හා රු142,200 ක් වටිනා දහම් පාසල් උපකරණ ලබා ගැනීමේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 53 | 38 | 15 |
| (ii) | තෘතියික මට්ටම | 44 | 22 | 22 |
| (iii) | ද්විතියික මට්ටම | 1,099 | 988 | 111 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 139 | 137 | 02 |
| | **එකතුව** | **1,335** | **1,185** | **150** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 150 ක් පැවති තිබුණත්, 2015 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුම අනුව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය නොකර ඉතිරි වී තිබුණත්, එම ඉතිරියන් කෙරෙහි කාර්ය මණ්ඩල පුරප්පාඩු පැවතීම බලපා නොතිබුණි.ඒ අනුව අනුමත කාර්ය මණ්ඩලය අධි ඇස්තමේන්තු කිරීමක් විගණනයේදී නිරීක්ෂණය විය.